**ශීර්ෂය-122 සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය**
**----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 122 **-** සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුලි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2023 දෙසැම්බර් 31 දිනට සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්**,** වියදම්**,** වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **නිරීක්ෂණය** වටිනාකම රු. | අනුකූල නොවීම | **ගණන්දීමේ නිලධාරීගේ** අදහස් දැක්වීම | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) මු.රෙ. 103(1) ආ ,එ හා 104(4) | | සොරකම්, වංචා, හදිසි අනතුරු යනාදී හානිවීම් සම්බන්ධයෙන් පොලීසියට වාර්තා කිරීම හා උචිත අවස්ථාවලදී බැංකුව, රක්ෂණ සමාගම, ඇප සහතිකකරුවන් යනාදීන් වෙත හිමිකම් පෑම් ඉදිරිපත් කිරීම කළ යුතු වුවත් 2022 අප්‍රේල් 19 දින අංක PD – 2791 දරන කැබ් රථයට වූ අනතුර සම්බන්ධයෙන් පොලීසියට හා අදාල රක්ෂණ සමාගමට වාර්තාකර නොතිබුණි. මු.රෙ.101(4) අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව එම අලාභය රථය අනියුක්ත කර තිබුණු නිලධාරියාගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබියදි රු.475,000 ක් වූ වියදම අමාත්‍යාංශය වැයකර අලුත්වැඩියා කර ඇතත් එම අලාභය 2024 මාර්තු 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | PD 2791 රථයේ අනතුරට අදාල අලාභයේ වටිනාකම මු.රෙ අවසන් පරීක්ෂණය ප්‍රකාරව වාහනය අනුයුක්තව සිටි නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කළද ප්‍රතිචාර නොලද බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති වෙත යොමු කර ඇත. | අලාභය නොපමාව අයකර ගත යුතුය. |
| (ii) මු.රෙ.104(4) (i) | | (i).අලාභ හානිය සිදුවූ දින සිට මාස 03 ක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් වටිනාකම රු.1,323,200 ක් වූ වාහන අනතුරු 06 | රථ වාහන අනතුරක් වූ වහාම ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව අදාල නිලධාරීන්,රියදුරන් දැනුවත් කර ඇති අතර පැවති අඩුපාඩු මඟ හරවාගෙන | පරීක්ෂණ වාර්තා නොපමාව ලබාගත යුතුය. |

| | | |
|---|---|---|
| ක් සම්බන්ධයෙන් 2024 මාර්තු 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කටයුතු කරමින් සිටී. අනතුර වූ වහාම පොලිසිය සහ රක්ෂණ ආයතනය ද අමාත්‍යාංශයද දැනුවත් කරන ලෙස රියදුරන් දැනුවත් කර ඇත.අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත අනුයුක්ත කර තිබූ වාහනවල සිදුවූ අනතුරු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේදී පැවති අඩුපාඩු, හේතුවෙන් මු.රෙ විධිවිධාන ප්‍රකාරව අදාළ පරීක්ෂණ පැවැත්වීමට බාධා ඇති විය. අදාළ පරීක්ෂණ පැවැත්වීම සඳහා නිලධාරීන් පත්කළ විට නිලධාරීන් රාජකාරී කටයුතු අධික වීමත්, සීමිත නිලධාරීන් පිරිසක් සිටීමත් නිසා එක් නිලධාරියෙකු පරීක්ෂණ එකකට වැඩි ගණනක් සඳහා පත්කර ඇති අවස්ථාද පවතින බැවින් අවසන් වාර්තා ලැබීමට ප්‍රමාද වීම නිසා නිසි ක්‍රියාමාර්ග ගැනීමට බාධා පැමිනේ. නමුත් දැනට අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා ද හැකිතාක් දුරට එකාබද්ධ සේවයේ රියදුරන් යෙදවීමට කටයුතු කර ඇති බැවින්, පැවැති අඩු පාඩු නිවැරදි කරමින් ඇත. | |
| (ii).2022 මැයි 09 දින අමාත්‍යවරයාගේ කාර්යාලයේ සිදුවූ ගින්නෙන් රු.395,500 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ විනාශ වීම සම්බන්ධයෙන් සිදුකල මු.රෙ.104(4) අවසන් පරීක්ෂණ වාර්තාව අනුව එම අලාභය හිටපු ඉඩම් අමාත්‍යවරයාගෙන් අයකර ගැනීමට 2023 සැප්තැම්බර් මස | අමාත්‍ය කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සඳහා වූ හානියේ වටිනාකම හිටපු ඉඩම් අමාත්‍යවරයාගෙන් අය කර ගැනීමට දැනුවත් කළද ප්‍රතිචාරයක් නොලද බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය . | අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිර්දේශ කර ඇතත් එම අලාභය අයකර ගෙන නොතිබුණි. | | |
| (ii) | මු.රෙ. 109(1) | අධිහාර, රක්ෂණ, ඇප යනාදිය වැනි සියලුම මාර්ගවලින් අයකර ගත යුතු මුදල් ප්‍රමාණයක් නිර්ණය කිරීමද ඇතුළුව සියලුම ප්‍රාරම්භක කටයුතු අවසන් කරනු ලැබීමෙන් පසුව හානියෙන් අයකර ගත යුතු උපරිම වටිනාකම හා අයකර ගැනීමට තීරණය කරන මුදලත් අතර වෙනසක් ඇත්නම් ඒ වෙනස පොත්වලින් ඉවත්කර දැමීමට අමාත්‍යාංශයට බලය හිමි වුවද එවැනි වෙනස්කම් පැවති අවස්ථා 11 කට අදාළව රු.2,724,100 ක ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය. | KI -1527 සහ PD - 2791 රථ වල අනතුරු වලට අදාල අලාභයේ වටිනාකම් මු.රෙ අවසන් පරීක්ෂණය ප්‍රකාරව වාහනය අනුයුක්තව සිටි නිලධාරියාගෙන් අයකර ගැනීමට තීරණය කර ඇත. නමුත් වගකිවයුතු නිලධාරියා එය නොගෙවීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති වෙත යොමු කර ඇත.<br><br>HQ – 7194 සහ PF – 0628 වාහන සඳහා මු.රෙ. 104(3) මූලික පරීක්ෂණ වාර්තා ලැබී ඇත. ඒ අනුව, ඉදිරි කටයුතු කිරීමට නියමිතය.<br><br>PE - 0628 - මෙම රථය හිටපු ඉඩම් අමාත්‍යවරයාට අනුයුක්තව තිබී ඇති අතර ඒ අනුව සිදු කරන ලද මු.රෙ 104(4) අවසන් පරීක්ෂණයේ නිර්දේශ අනුව වාහනය අනුයුක්තව සිටි හිටපු ඉඩම් අමාත්‍යවරයාගෙන් අලාභයට අදාල අලුත්වැඩියා මුදලින් සියයට 50 ක් අයකර ගැනීමට නියමිතය.<br><br>PC – 2294, HQ- 7232, PF – 6071, KV-0433 සහ CAK – 4226 වාහන වෙනුවෙන් මු.රෙ 104(4) ප්‍රකාරව අවසන් පරීක්ෂණය සඳහා නිලධාරීන් මණ්ඩලයක් පත්කර ඇති අතර එම පරීක්ෂණ වාර්තාව ලද පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛය | අමාත්‍යාංශය විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි | පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කිරීමට මේ වන විට කටයුතු කරමින් සිටී. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.2 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයෙන් අයකල සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල වූ රු.873,081 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | දත්ත පද්ධතියෙ ලියාපදිංචි කිරීම අවසන් කර ඇති නිලධාරීන්ගේ මාසික වැටුපෙන් අයකරන රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නිසි පරිදි මාසිකව ප්‍රේෂණය කරන අතර පොදු තැම්පත් ගිණුමේ පවතින ශේෂය මෙතෙක් තොරතුරු ලබා නොදීම මත ලියාපදිංචි කිරීමට නොහැකි වූ නිලධාරීන්ට අදාල දායක මුදල් වේ. ඔවුන්ගේ තොරතුරු ගෙන්වා ගැනීමට තවදුරටත් කටයුතු කරමින් පවතී. | කඩිනමින් සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පනත් සංශෝධනය කර ගැනීම අමාත්‍යාංශයේ අපේක්ෂාව වුවද 2023 වර්ෂය තුළදී එම අනපනත් සංශෝධනය කර ගැනීමේ කටයුතු සම්පූර්ණ වී නොතිබුණි. විස්තර පහත දැක්වේ. | | |

| | | | |
|---|---|---|---|
| (i). | 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතට අදාළ රෙගුලාසි සංශෝධනය | මෙම පනතට අදාළ රෙගුලාසි සංශෝධන කටයුතු ආරම්භ කර ඇත්තේ 2023.12.12 වන දිනය. ඒ අනුව, අංක 03/01/01/සංශෝධන හා 2023.12.12 දිනැති ලිපිය මගින් 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත හා එහි නියෝග/රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ පළමු රැස්වීම 2023.12.19 වන දින පවත්වන ලද බව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. | අදාළ සංශෝධන කඩිනමින් සිදුකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii). | 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය | 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය, 2022 අංක 11 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත ලෙස 2022.03.25 දිනැති ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළකර ඇත. නැවත නේවාසික කටයුතු සඳහා ඉදිරියේදී ලබා දෙන සියලු බලපත්‍ර සඳහා එම කොන්දේසි රහිත පූර්ණ අයිතිය ඇති දීමනාපත්‍රයන් නිකුත් කිරීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී, කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සමඟ අදාළ කටයුතු සිදුවෙමින් පවතින අතරතුර මෙම කාරණයට හා සමානවම "උරුමය වැඩසටහන" යටතේ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර එයට ලද අනුමැතිය අනුව දැනට ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දීමනාපත්‍ර, බලපත්‍ර ලබා දී ඇති සහ අලුතින් ඒ සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් වෙත සින්නක්කර ඔප්පු ලබාදීම ආරම්භකර මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීමෙන් අපේක්ෂා කළ අරමුණම උරුමය වැඩසටහන මඟින් මේ වන විටත් සිදුවන බැවින් මෙම කාරණය සම්බන්ධව පනත සංශෝධනය කෙසේ විය යුතුද යන්න නීති කෙටුම්පත් වෙතින් මෙතෙක් අප වෙත දන්වා නොමැත. | අදාළ සංශෝධන කඩිනමින් සිදුකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii). | 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත සංශෝධනය | නීති කෙටුම්පත් සම්පාදක සමඟ සාකච්ඡාවට පවත්වමින් අවසන් කෙටුම්පත සකස් කිරීම සිදු කරගෙන යනු ලබන අතර මෙම පනත සංශෝධනය කිරීම ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් පනත සංශෝධනය කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා ගතවන කාලය නිශ්චිතව සඳහන් කළ නොහැක. | අදාළ සංශෝධන කඩිනමින් සිදුකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv). | 1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ස්ථාපනය කිරීමේ පනත සංශෝධනය | 1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ස්ථාපනය කිරීමේ පනත සංශෝධනය කිරීම 2023 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් කර නොමැත. එහෙත් අවශ්‍යතාවය මත මෙම පනත සංශෝධනය සඳහා ආරම්භක පියවර වශයෙන් අංක 5/6/1/1/CM/21/VII-I හා 2023.11.16 දිනැතිව මෙම අමාත්‍යාංශය විසින් මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ස්ථාපනය කරන ලද 1969 අංක 21 දරන පනත සංශෝධනය කිරීමේ අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ඒ අනුව, අංක අමප/23/2215/615/063 හා 2023.12.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් එම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අනුමැතිය ලැබී ඇති අතර නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධිත පනත් කෙටුම්පත සකස් කරමින් පවතී. | අදාළ සංශෝධන කඩිනමින් සිදුකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (v). | 1979 අංක 43 දරන රජයේ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය | 1979 අංක 43 දරන රජයේ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම 2023 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් කර නොමැත. එහෙත් අවශ්‍යතාවය මත මෙම පනත සංශෝධනය කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් 2023.12.12 දින කමිටුවක් පත් කරන ලද අතර, මෙම කමිටුව මඟින් ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතෙහි සංශෝධනය කළ යුතු වගන්ති හඳුනා ගැනීමේ සහ පනත සංශෝධනයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි කෙටුම්පත සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | අදාළ සංශෝධන කඩිනමින් සිදුකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (vi). | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අදාළව රෙගුලාසි සංශෝධනය | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අදාළව රෙගුලාසි සංශෝධනය කිරීම 2023 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් කර නොමැත. එහෙත් 2023.12.05 දින ව්‍යාපෘති අංශය විසින් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ රෙගුලාසි සංශෝධනයට අදාළව ගැසට් කරන ලද අංක 2308/27 හා 2022.12.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. ඒ අනුව, ගැසට් පත්‍රය පාර්ලිමේන්තු අනුමැතිය සඳහා 2024.03.05 දින පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත. සංශෝධිත රෙගුලාසි ඇතුළත් ගැසට් පත්‍රය සම්බන්ධයෙන් සලකා බැලීම සම්බන්ධයෙන් වන උපදේශන කාරක සභා රැස්වීම 2024.04.26 වන දින පාර්ලිමේන්තුවේදී පවත්වන ලදී. | අදාළ සංශෝධන කඩිනමින් සිදුකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (vii). ජාතික ඉඩම් කොමිෂන් සභා පනත සම්පාදනය කිරීම | ජාතික ඉඩම් කොමිෂන් සභා පනත සකස් කිරීම ආරම්භ කරන ලද්දේ 2023.06.21 දිනැතිව ජාතික ඉඩම් කොමිෂන් සභා පනත සකස් කිරීම මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම මඟිනි. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව රජයේ ඉඩම් බැහැර කිරීමට අදාළව ප්‍රතිපත්තියක් සකස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද අමාත්‍ය මණ්ඩල අනුකමිටුව වෙත යොමු කිරීමට තීරණය කර ඇත.<br>"ජාතික ඉඩම් කොමිෂන් සභා පනත සකස් කිරීම" මැයෙන් වූ 2023.10.02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ජාතික ඉඩම් කොමිෂන් සභා පනත නමින් නව පනතක් හඳුන්වාදීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, පනත සම්පාදනය කිරීමේ කටයුතු නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් පවතී. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් අවසාන කෙටුම්පත එකඟතාවය ලබාගැනීම සඳහා 2024.04.17 දිනැතිව මෙම අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | අදාළ සංශෝධන කඩිනමින් සිදුකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (viii). යෝජිත නව ඉඩම් පනත සම්පාදනය කිරීම | යෝජිත නව ඉඩම් පනත කෙටුම්පත් කිරීම 2023 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් කර නොමැත. නමුත් අවශ්‍යතාවය මත යෝජිත නව ඉඩම් පනත කෙටුම්පත් කිරීමට අදාළ පළමු කමිටු රැස්වීම් වාරය 2023.07.20 දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී පවත්වන ලද අතර ඉන් පසුව කමිටු රැස්වීම් වාර 05ක් පවත්වන ලදි.<br>“යෝජිත නව ඉඩම් පනත කෙටුම්පත් කිරීම සඳහා පත් කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත කමිටුව සඳහා කාර්යභාරය පැවරීම සහ එම කමිටුවේ නිලධාරීන්ට දීමනාවක් ලබාදීම” මැයෙන් 2023.08.04 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව යෝජිත නව ඉඩම් පනත කෙටුම්පත් කිරීම සඳහා පත් කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවේ නිලධාරීන්ට දීමනාවක් ලබාදීම සම්බන්ධයෙන් අනුමැතිය ලැබී නොමැති හෙයින් කමිටුව රැස්වීමේ ප්‍රායෝගික ගැටළු මතු වී ඇති බැවින් කමිටුව රැස්වීම තාවකාලිකව නවතා ඇත. | අදාළ සංශෝධන කඩිනමින් සිදුකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ix). | ඉඩම් පරිපාලනය සම්බන්ධ ලෝක බැංකු වැඩසටහන | ඉඩම් පරිපාලනය සම්බන්ධ ලෝක බැංකු වැඩසටහන2023 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් කර නොමැත. මෙම වැඩසටහන ලෝක බැංකුව විසින් ක්‍රියාත්මක කරන වැඩසටහනක් වන අතර 2023.07.17 දින මීට අදාල මූලික සාකච්ඡාව පවත්වන ලදී. ඉන් අනතුරුව, ඉඩම් ප්‍රතිපත්ති සහ පරිපාලනය සම්බන්ධයෙන් බුද්ධි කලම්භන වැඩමුළුව 2023.11.08 දින පවත්වන ලදී. | අදාළ සංශෝධන කඩිනමින් සිදුකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2023 අයවැය යෝජනා තුළ වෙරළාශ්‍රිත සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් බූන්දල ජාතික වනෝද්‍යානයේ නරඹන්නන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා රු. මිලියන 9.9 ක් වැයකොට ඇතත් 2023 දෙසැම්බර් 31 දිනය වන විට එහි සියයට 60 ක ප්‍රගතියක් පමණක් අත්කර ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | බූන්දල ජාතික උද්‍යානයේ සංචාරක පහසුකම් මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන 9.89 ක ප්‍රතිපාදන 2023.06.15 දින වන විට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මෙම අමාත්‍යාංශය මඟින් නිදහස් කොට ඇත.ඒ අනුව 2023.10.13 දින වන විට ටෙන්ඩරය ප්‍රදානය කොට ගිවිසුම් අත්සන් කොට ඇති අතර මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා ගිවිසුම් අනුව 2024 වර්ෂයේ මැයි මස 14 වන දින දක්වා කාලය ලබා දී ඇති බව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. එමෙන්ම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමෙන් පසු පළමු වාරිකය වශයෙන් අදාල ඉදිකිරීම් සමාගමට රු. 1,395,912 ක මුදලක් 2023.12.30 වන දින ගෙවීම් කරන ලදී. | වැය කරන ප්‍රතිපූර්ණවලින් උපරිම කාර්යක්ෂමතාවයක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.1.2 මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබූ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංචාරක අමාත්‍යාංශය 2021 වසරේ දී ක්‍රියාත්මක කිරීමට යෝජනා කළ නානුඔය දුම්රිය ස්ථානය වැඩි දියුණුකිරීමේ ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.74,630,925 ක් විය. නවීකරණය ත්‍රෛපාර්ශවීය ගිවිසුමක් යටතේ සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන්, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) මගින් 2021 වසරේ ආරම්භකර මාස 9 ක කාල සීමාවක් තුල අවසන් කිරීම සැලසුම් කර ඇතත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමට මාස 5 කට අධික කාලයක් ගතවීම හේතුවෙන් එම ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.එම කාර්යය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මුළු ඇස්තමේන්තු මුදලින් සියයට 16 ක්ද , ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | | |

| | | | |
|---|---|---|---|
| | සියයට 84 ක්ද දැරිමට එකඟවී 2023 වර්ෂයේ දී වැඩ ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | 2023 මැයි මස 03 දිනැති ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශයේ ව්‍යාපෘති කලමනාකරුගේ ලිපියෙන් නානුඔය දුම්රිය ස්ථානය වැඩි දියුණුකිරීමේ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සඳහා රු.106,438,331 ක සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුවක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. මෙම වටිනාකම මුල් වටිනාකමට වඩා සියයට 72 ක වැඩිවීමක් වූ අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොතිබුණි. | මන්නාරම් කොටුවේ අභ්‍යන්තර ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම හා නානු ඔය දුම්රිය ස්ථානය නවීකරණය කිරීම සම්බන්ධ වර්තමාන තත්ත්වය දැනුම් දීම මැයෙන් 2023.02.28 දිනඅමාත්‍ය මණ්ඩල සංදේශ අංක MT/2023/05 මගින් අමාත්‍ය මණ්ඩල සටහන යොමු කර ඇත.<br>මෙම ව්‍යාපෘතිය අවම මට්ටමෙන් කර ගෙන යාමට අත්‍යාවශ්‍ය නිම කිරීම් සඳහා නව මිල ගණන් යටතේ රු.මි. 120ක ප්‍රතිපාදන අවශ්‍ය බව එමගින් දැනුම් දී ඇත.ඒ අනුව, උක්ත අමාත්‍ය මණ්ඩල සටහන සඳහා අනුමැතිය 2024.04.18 දින අංක අමප/23/053/615/021 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා දි ඇත.<br>2024 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු ආරම්භ කිරිමේදි අදාල මිල ගණන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අමතර පිරිවැය වැඩවීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ ගත යුතුය. |
| (ii) | ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගම වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් ඉදිරිපත් කල රු.10,248.187 ක බිල්පත් වටිනාකම මේ දක්වා ගෙවා නොතිබුණි. | 2024.03.26 දින ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් අරමුදල් ලබා දී ඇත.<br>මේ වන විට ප්‍රතිපාදන ලැබී ඇති බැවින් ව්‍යාපෘතියෙහි වැඩ කටයුතු නැවත කඩිනමින් අරම්භ කර අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | බිල්පත් නොපමාව පියවිය යුතුය. |
| (iii) | 2024 මාර්තු මස 11 දින ජාතික විගණන කාර්යාලයේ විගණන නිලධාරීන් හා නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරි සමඟ නානු ඔය දුම්රිය ස්ථානය තුල සිදු කළ භෞතික පරීක්ෂාවේදී ව්‍යාපෘති වැඩ කටයුතු නිම නොකිරීම හා නිම කර ඇති කොටස් නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් එනම් අළුත් වැඩියාවට කඩාදමා තිබුණු පඩිපෙල, වැසිකිලි අපිරිසිදු හා අවලස්සන ආකාරයෙන් පැවැතීම, අසුන් ගැනීමට ඇති බංකු ප්‍රමාණවත් නොවීම හා මලකා අබලන් තත්ත්වයේ පැවැතීම ආදී අඩුපාඩු නිරීක්ෂණය විය.මේ අනුව,වසර ගණනාවක් නිම නොකරන ලද වැඩ හේතුවෙන් දුම්රිය ස්ථානය සංචාරක | ශ්‍රී ලංකා සංචාරක සංචාරක ප්‍රවර්ධන ප්‍රතිපාදන ලබා දී ඇති බැවින්, මේ වන විට අඩක් නිම කර ඇති සියලු කාර්යයන් සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව දන්වමි. | මහජනතාවට ප්‍රසන්න ආකාරයෙන් දුම්රිය ස්ථානය නඩත්තු කර පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආකර්ෂණයට යෝග්‍ය නොවන ආකාරයෙන් පවත්වාගෙන ගොස් තිබුණි. | | |
| (ආ) | අමාත්‍යාංශයේ සංචාරක අංශයේ 2023 අයවැය යෝජනා තුල වෙරළාශ්‍රිත සංචාරක කටයුතු ප්‍රවර්ධනය (Promotion of Marine Tourism) සඳහා ව්‍යාපෘති/වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.මිලියන 14.69 ක් විය.එහිදි හඳුනාගත් එක් ව්‍යාපෘතියක් වන පරෙවි දූපතේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන වලට පටහැනි බැවින් එය අත්හැර සලසා තිබූ රු.මිලියන 4.69 ක් වැයකර බෝට්ටු 02 ක් මිළදි ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | මුදල් අමාත්‍යාංශය වෙතින් හා ප්‍රවාහන අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපාදන විමසන ලදී. එම ප්‍රතිපාදන නොලැබුණු අතර මුදල් අමාත්‍යාංශය විසින් ලබා දුන් උපදෙස් අනුව අවශ්‍ය ප්‍රතිපාදන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙතින් ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. එකී අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ලබා දීමට එකඟ වූ සියයට 16 ක ප්‍රතිපාදන ලබා දී ඇත.ශ්‍රීලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ලබා දීමට එකඟ ඉතිරි සියයට 84 ක ප්‍රතිපාදන 2024.03.26 දින ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ලබා දී ඇති බැවින්, මෙම ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත. එකඟ වූ පරිදි 2024.05.02 දින සිට නැවත ව්‍යාපෘතිය ආරම්භ කිරීමට තීරණය කරන ලදී. | සැලසුම් කරන ලද ව්‍යාපෘති ප්‍රයෝජනවත් හා අර්ථවත් ආකාරයෙන් කළ යුතුය. |

**3.2 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයාට ලබාදී තිබූ වාහනය 2016 වර්ෂයේදී පුද්ගලික සමාගමකින් මිළදිගත් ලැන්ඩ් රොවන් ඩිස්කවරි වර්ගයේ වාහන 02 ක රජයේ තීරු බදු සහන යටතේ ආනයනය කර මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ වාහන විය.මේ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ඇතුලත් 2023 මැයි 29 දිනැති MOF/DG/LAD/CO/53/2023 අංක දරණ ලිපියෙහි ඡේද අංක 01 ප්‍රකාරව රාජ්‍ය ආයතන වෙත වාහන මිලදී ගැනීමේ පොදු ප්‍රතිපත්තිය උල්ලංඝණය කරමින් මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර කිරීමත්,ඡේද අංක 02 මගින් ලියාපදිංචි කරන ලද මෝටර් රථ රජයට මිලදී ගැනීම හා | අදාළ වාහන දෙක මිලදී ගැනීම සම්බන්ධව විගණන අධිකාරී පවසන හා මෙතෙක් විසඳුමක් ලබාදීනැති ගැටළුව සම්බන්ධව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මගින් ද විමර්ශනයක් සිදුකරමින් පවතින අතර මීට අමතරව, මෙම අමාත්‍යාංශයේ (ඉඩම් අංශයේ) අතිරේකලේකම් (සංවර්ධන)ගේ සභාපතිත්වයෙන් යුතුව පත්කරනලද කමිටුවක් මගින් දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සිදුකරමින් පවතින බවද කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව සියලු මිලදීගැනීම් සිදු කළ යුතුය. |

ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝණය කිරීම සම්බන්ධ පරීක්ෂණයක් කඩිනමින් පවත්වා ඊට අදාල නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකළ යුතු බව දන්වා තිබුණි. වසරකට ආසන්න කාලයක් ගතව ඇතත් උක්ත උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කළ කාබනික පොහොර ව්‍යාපෘතිය අවසන් කොට සම්පත් බැහැර කිරීම පිළිබඳ 2023 මාර්තු 28 දිනැති අමප/23/383/615/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට හේතු වී ඇති කරුණු, එහි මුදල් එහි මුදල් භාවිතා වී ඇති ආකාරය සහ ඒ සඳහා දායක වූ පාර්ශවයන් පිළිබඳව ස්වාධීන පූර්ණ විමර්ශනයක් සිදු කිරීමට මෙම ව්‍යාපෘතියට අදාල ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සුදුසු යෝජනා සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කර තිබුණ ද 2024 අප්‍රේල් විගණිත දින දක්වාම එම කටයුතු සම්පූර්ණ කර අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | උක්ත ව්‍යාපෘතිය අවසන් කොට සම්පත් බැහැර කිරීම පිළිබඳව 2023.03.28 දිනැති අංක අමප/23/0383/615/017 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් විශේෂ විමර්ශන කමිටුවක් පත් කර ඇති අතර, අදාල සියළු තොරතුරු එම කමිටුව වෙත ලබා දී ඇත. එහෙත් එම කමිටු වාර්තාව 2023 නොවැම්බර් මස 20 වන දින වන විටත් ලැබී නොතිබුණ හෙයින් පළමු සිහිකැඳවීමේ ලිපිය 2023.11.20 වන දින කමිටු සභාපති වෙත නිකුත් කර ඇත. මෙතෙක් එම වාර්තාව අමාත්‍යාංශය වෙත ලැබී නැත. | කාබනික පොහොර ව්‍යාපෘති වාර්තාව නොපමාව ලබාගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශයේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා වසර 10 කට වැඩි කාලයක් ගත කිරීම හේතුවෙන් ඉඩම් අත්පත් වන්දි පමණක් ගෙවීම වෙනුවට මෙම කටයුතු ප්‍රමාද වීම තුළින් වන්දිලාභීන්ට අමතර පොළී ලෙස විශාල වියදමක් රජයේ මුදලින් ගෙවන බව නිරීක්ෂණය විය.විස්තර පහත දැක්වේ. | | |
| (i) | මාතර දිස්ත්‍රික්කය දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බැද්දේගම්මැද්ද ග්‍රාම නිලධාරී වසමේ මාර / 2794 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 35 දක්වා (කැබලි අංක 20 හා 23 හැර) පිඹුරේ හෙක්ටයාර් 0.305 ක් විශාල ඉඩම් කොටස සඳහා පනතේ 7 වගන්තිය ප්‍රකාරව 2165/69 දරණ 2020.03.06 දිනැති ගැසට් පත්‍රය 2020.07.23 දින සිට ප්‍රදර්ශණය කර ඉඩමේ අයිතිකරු වෙත, | මෙම අත්කර ගැනීම 2015 වර්ෂයේදී ආරම්භ කර අංක 2053/5 හා 2018.01.08 දිනැති ගැසට් පත්‍රය මඟින් රජයට පවරා ගෙන ඇත. 2018.04.06 දින 5 ප්‍රකාශය ද, 2020.03.06 දින අත්කර ගැනීමේ පනතේ 7 වගන්තිය යටතේ ගැසට් නිවේදනය නිකුත් කර හිමිකම් පරීක්ෂණ පවත්වා ඇත. හිමිකම තීරණය කිරීමෙන් අනතුරුව 2020.11.07 දින 10(1) අ තීරණයද නිකුත් කර ඇත. 2021.04.05 දින තක්සේරු වාර්තාව ලැබීමෙන් පසු | ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතරව රජය විසින් වැය කරන පොලී වියදම අඩුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත |

| | | | |
|---|---|---|---|
| | පනතේ 38(අ) අතුරු විධාන ආඥාව 2018.01.08 දින ලබාදී ඉඩම් කැබලි 33 අත්පත් කර ගැනීම සඳහා එහි අයිතිකරු වෙත 2022 පෙබරවාරි 23 වන්දි මුදල් ලෙස රු.43,700,100 ක් ගෙවා තිබුණි.මෙම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුවීමට වසර 4 යි. මාස 01 යි දින 15 ක් ගතවීම නිසා ඒ සඳහා අමතර පොළී මුදල් ලෙස රු.12,616,658 ක් ගෙවා ඇති බව ලිපිය අනුව අනාවරණය විය. | 2021.04.28 දින 17 තීරණය නිකුත් කර ඇති අතර, 2021.12.13 වන්දි ප්‍රතිපාදන ද, 2022.11.19 දින පොලී ප්‍රතිපාදනද නිදහස් කර ඇත. ඒ අනුව අත්කර ගැනීමේ පනතට අනුව සමාන්‍ය අත්කර ගැනීමේ ක්‍රියාවලියක් සඳහා සති 149 – 173ත් අතර කාලයක් ගත වන අතර, අත්කර ගැනීමක් ක්‍රියාත්මක කිරීමේදී ආයතන කිහිපයක් සම්බන්ධ වෙමින් කටයුතු සිදු කරන අතර, ගත වන කාලය හේතුවෙන් පනතේ නියමිත කාලයට වැඩි කාලයක් ගත වී ඇති බව නිරීක්ෂණය කරමි. | යුතුය. |
| (ii) | ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නකල්ස් සංරක්ෂණ කලාපයට ඉඩම් අත්පත් කරගැනීම සඳහා ගෝනමඩවත්ත ඉඩම පවරා ගැනීමට 2010 මාර්තු 17 දින ඉලුක්කුඹුර ග්‍රාම නිලධාරී කාර්යාලයේ දැන්වීම් ප්‍රදර්ශණය කර 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනත 460 වෙනි පරිච්ඡේදය 17 වෙනි වගන්තිය ප්‍රකාරව සිදුකර තිබුණි.මෙම ඉඩමේ හිමිකරුවකුට එහි අයිතිය මු.වි.මා.1659 හි කැබලි අංක 01 දරණ ඉඩමේ පර්චස් 89 ක්ද, නැවත පර්චස් 17.165 ක් ද නැවතත් පර්චස් 17.165 ක්ද වශයෙන් පර්චස් 123.33 ක් පවරා ගැනීම සම්බන්ධයෙන් 38(අ) වගන්තිය ප්‍රකාර 2013.11.21 දින අතුරු විධානය පළකර වසර අවුරුදු 7 යි මාස 1 දින 22 කට පසුව 17 වන වගන්තිය යටතේ වන්දි මුදල් ලෙස රු.31,770,300 ක්ද, ඒ සඳහා අමතර පොළිය වශයෙන් රු.14,955,327 ක් 2022 ජූලි මාසයේදී ගෙවා තිබුණි. | නකල්ස් සංරක්ෂණ කලාපය සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාළව 2000 වර්ෂයේදී මෙම අත්කර ගැනීම ආරම්භ කර ඇති අතර, අත්කර ගැනීමේ පනත ප්‍රකාරව 4 වගන්තිය ද, අංක 1837/37 හා 2013.06.13 දිනැති ගැසට් පත්‍රය මඟින් 38(අ) අතුරු විධානය ආඥාව හා 5 ප්‍රකාශය ද නිකුත් කර අංක මං 1659 පිඹුරද සකස් කර ඇත. 2016.10.05 දින 7 වගන්තිය නිකුත් කර හිමිකම් පරීක්ෂණ පවත්වා හිමිකම තහවුරු කිරීමෙන් අනතුරුව 2018.08.30 දින 10(1) අ තීරණයද, 2020.05.13 දින 17 තීරණයද නිකුත් කර ඇත. 2020.10.24 දින වන්දි ගෙවීම් කටයුතු සිදුකර ඇත. ඒ අනුව 9 වන වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ අවස්ථාවේදී ඇතිවන විවිධාකාරයේ ගැටළු හේතුවෙන් එනම් හිමිකම් සඳහා ඉදිරිපත් වන පුද්ගලයන් විසින් ඉදිරිපත් කරන ලේඛන වල පැහැදිලි නොවීම, ආරවුල් ආදී හේතු මත හිමිකම් පරීක්ෂණ සඳහා ගතවන කාලය දීර්ඝ වීමට හැකියාව ඇත. එය පාලනය කිරීම මෙම අමාත්‍යාංශයට හැකියාවක් නොමැත. | ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතර පොලී වියදම අඩුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | වීරඹුගෙදර පොලිස් ස්ථානය ස්ථාපිත කිරීම සඳහා වයඹ පලාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 870 - ගෝනව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අක්කර 01, රූඩ් 03, පර්චස් 37.01 ප්‍රමාණයකින් 2016.06.24 දින පනතේ 02 වගන්ති ප්‍රකාරව දැන්වීම් පළකර 2019.01.11 දින පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කර තිබුණි. අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 0.7944 ක් වේ. එහි අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වන අතර එහි තක්සේරු | මෙම අත්කර ගැනීමට අදාළව 2016.06.24 දින පනතේ 2 වගන්තිය යටතේ දැන්වීම් ප්‍රදර්ශනය කර අත්පත් ක්‍රියාවලිය ආරම්භ කර ඇත. පනතේ 4 වගන්තිය හා 5 ප්‍රකාශයද නිකුත් කර 7 වගන්තිය යටතේ කටයුතු කර ඇත. අනතුරුව හිමිකම් පරීක්ෂණයද පවත්වා හිමිකම තීරණය කිරීමෙන් පසු 2022.04.2 දිනැතිව අප විසින් ප්‍රාදේශිය ලේකම් වෙත ප්‍රතිපාදන නිදහස් කර ඇත. මෙම අත්කර ගැනීම පනතේ සමාන්‍ය ක්‍රමවේදය යටතේ සිදු කර ඇති බැවින් මේ සඳහා පොලී ගෙවීමක් සිදු කිරීම අවශ්‍ය නොවේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම රු.12,564,000 කි. මේ සඳහා 2022.04.31 දිනැති ඉඩම් අත්පත් අධ්‍යක්ෂකගේ ඉඩම් අමාත්‍යංශය ප්‍රධාන මූල්‍ය නිලධාරි, අමතන ලද ලිපියට අනුව වන්දි මුදල් ගෙවීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් රු.12,564,000 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. 2023 දෙසැම්බර් විගණිත දින වන විටද මෙම ක්‍රියාවලියට වසර හයාමාරක(6 ½) පමණ ප්‍රමාද වීමක් සිදු වී තිබුණු අතර ඒ සඳහා අමතරව විශාල පොළියක් ගෙවීමට සිදු වන බවද නිරීක්ෂණය විය. | | |
| (iv) | කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම්ට අයත් මාළඹේ පිහිටි බාලිකා විද්‍යාලයක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ මාලඹේ හික්ගහවත්ත ඉඩමෙන් මු.පි.කො 9134 හි කැබලි අංක 01 සහ 02 වන ඉඩමෙන් හෙක්ටයාර් 0.23522 ක් අත්පත් කරගෙන ඒ සඳහා 38(අ) අතුරු විධානය පලවූ දිනය 2010.02.15 දින විය.මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා අත්පත් ප්‍රදානය නිකුත් කල දිනය 2020.06.23 වූ අතර ඒ සඳහා පනතේ 17 වගන්තිය යටතේ ඉඩම් හිමිකරු වූ ද පිනැන්ස් සමාගමක් වෙත ප්‍රදානය කල වන්දි මුදලේ වටිනාකම රු.40,140,000 ක් විය. කෙසේ වුවද මෙම අත්පත් කර ගැනීම සඳහා 38(අ) අතුරු විධානය පලවී වසර 10 යි මාස 09 දින 15 කට පසුව අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සිදුවී තිබීමෙන් ඒ සඳහා රු.30,320,821 ක අමතර පොලී මුදලක්ද ගෙවීමට සිදුවී තිබුණි. | රාහුල බාලිකා විද්‍යාලය සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාළව 2008.07.31 දින අත්කර ගැනීම ආරම්භ කර හෙක්ටයාර 0.2362 ක් සඳහා 2009.04.01 දින 4 වගන්තිය යටතේ නියමය ද, අංක 1641/4 හා 2010.02.15 දිනැති ගැසට් පත්‍රය මඟින් 38(අ) අතුරු විධානය නිකුත් කර ඇත. 9 වන වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ පවත්වා හිමිකම තීරණය කිරීමේ පසු 10(1) දැන්වීම 2014 .06.26 දිනැතිව නිකුත් කර ඇත. ඉඩම සඳහා හිමිකම් කියන්නන්ට අදාළ වන්දි මුදල තීරණය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර 2020.06.08 දින තක්සේරු වාර්තාව ලැබී ඇති අතර 2020.06.23 දින 17 තීරණයද නිකුත් කර ඇත. එහිදී තක්සේරුව ලබා ගැනීම සඳහා වසර 5ක පමණ කාලයක් ගත වී ඇති බැවින් 17 තීරණය නිකුත් කිරීම ප්‍රමාද වී ඇත. | ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතරව පොලී වියදම අඩුකර ගත යුතුය. |
| (v) | අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව පොලිස් ස්ථානය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම යටතේ ,ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් අයිතිකරු වන සර්වෝදය ශ්‍රමදාන සංගමයකට අයත් දම්සක් මන්දිරය නො.98, රාවතාවත්ත පාර, මොරටුව ආයතනයේ හෙක්ටයාර් 1.0120 ක් රජයට අත්පත් කරගෙන ඒ සඳහා 38(අ) අතුරු විධානය 2015.12.15 පළකර තිබූ අතර වන්දි වශයෙන් රු.18,484,750 ක්ද ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වසර 6 මාස 10 දින 12 ක ප්‍රමාදය මත පොලිය ලෙස රු.8,884,412 ක්ද වශයෙන් රු.10,263,954 ක් ගෙවා තිබුණි. | පදියතලාව පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී මෙම අත්කර ගැනීම ආරම්භ කර ඇති අතර 2015.10.14 දින 2 වගන්තිය යටතේ දැන්වීම් ප්‍රදර්ශනය කර ඇත. 2015.12.15 දින අංක 1945/11 දරණ 38(අ) අතුරු විධාන ගැසට් පත්‍රය මඟින් රජයට අත්කර ගෙන ඇති අතර, 5 ප්‍රකාශය 2017.07.05 දින ද, 2019.05.21 දින 7 වගන්තිය යටතේ ගැසට් නිවේදනයද නිකුත් කර ඇත. පසුව 9 වන වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ පවත්වා 2021.11.02 දින 10(1)අ තීරණය නිකුත් කර ඇත. 2021.12.22 දිනැතිව වන්දි ප්‍රතිපාදන සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් ඉල්ලුම් කල නමුත් 17 | ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතර පොලී වියදම අඩුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තීරණයේ සංශෝධනයන් සිදු කල යුතු බැවින් නැවත 17 තීරණය සංශෝධනය කිරීමට කටයුතු කර 2022.04.04 දිනැතිව 17 තීරණය නිකුත් කර ඇත. ඒ අනුව ඒ සඳහා 2022.05.05 දින වන්දි ද, 2022.12.09 දින පොලී ප්‍රතිපාදන ද අමාත්‍යාංශය විසින් නිදහස් කර ඇත. | |
| (vi) | නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ සංවර්ධන කටයුතු සඳහා A,C,F සහ J ඉඩම් කැබලි අත්පත් කර ගැනීම සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් නිවිතිගල, කලවාන පාර පදිංචි පුද්ගලයෙකුගෙන් ඉඩමක් පවරා ගැනීම සඳහා අත්පත් කර ගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා 2017.01.19 දින 38(අ) අ.වි පලකර ඇති අතර ඒ සඳහා වන්දි ගෙවීම 2023.01.04 දින සිදු කර තිබුණි. ඒ අනුව වන්දි ගෙවීමට ප්‍රමාද වූ කාලය අවු 5 මාස 11 දින 16 ක් වූ අතර මේ සඳහා වන්දි වශයෙන් රු.1,255,000 ක් ද, ඊට පොලිය වශයෙන් රු.523,630 ක්ද ගෙවා තිබුණි. | නිවිතිගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී මෙම අත්කර ගැනීම ක්‍රියාත්මක වී ඇති අතර, 2014.08.22 දින 2 වගන්තිය යටතේ නියමයද, 4 වගන්තිය යතේ නියමය 2015.07.13 දිනද නිකුත් කර ඇත. එමෙන්ම 2017.01.19 දින 38(අ) අතුරු විධානය යටතේ ආඥාව නිකුත් කර ඇති අතර 5 ප්‍රකාශය හා 7 ප්‍රකාශයන් පිළිවෙලින් 2017.06.23 දින හා 2019.05.30 යන දිනයන්හිදි නිකුත් කර ඇත. ඒ අනුව 9 වන වගන්තිය යටතේ හිමිකම් පරික්ෂණ පවත්වා 2022.07.15 දින 10(1) තීරණය නිකුත් කර ඇත. එහිදී හිමිකම් තහවුරු කර ගැනීමේදී ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් හිමිකම් තහවුරු කර ගැනීමට යම්කිසි කාල සීමාවක් අත්කර ගැනීමේ නිලධාරී වන ප්‍රාදේශිය ලේකම් වෙත ගත වී ඇති බැවින් හිමිකම තහවුරු කර ගැනීමට හා වන්දි මුදල ප්‍රකාශ කිරීමට වසර තුනක පමණ කාල සීමාවක් ගත වී ඇත. ඒ අනුව ඉහතින්ද සඳහන් කර ඇති පරිදි හිමිකම් පරික්ෂණ අවස්ථාවේදී ඇතිවන ගැටළුකාරී තත්ත්වයන් මත හිමිකම් පරික්ෂණ අවසන් කිරීමටත්, අත්කර ගැනීම අවසන් කිරීමටත් ගතවන කාලය සීමා කිරීමට හැකියාවක් නොමැත. | ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතර පොලී වියදම අඩුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වාහන අපහරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් ධාවනයෙන් ඉවත් කර ඇති හා ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන හඳුනාගෙන එම වාහන අපහරණය කිරීම සඳහා පත්කරන ලද අපහරණ කමිටුවේ කමිටු වාර්තාව 2023 නොවැම්බර් 04 දින ඉදිරිපත් කර තිබුණද 2024 අප්‍රේල් මස 30 දින වන විටත් එම කටයුතු සිදුකර නොතිබුණි. | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් වාහන 6 ක් අපහරණය සඳහා නිර්දේශ වී ඇත. ඒ අනුව, මේ වන විට තක්සේරු කමිටු පත්කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | වාහන අපහරණය කඩිනමින් සිදු කල යුතුය. |

### 3.4.2 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංචාරක අමාත්‍යාංශය සතු වාහනයක් 2019 වර්ෂයේදි අනතුරකට පත්වී ඇතත් ඒ සඳහා කිසිදු මු.රෙ. පරික්ෂණයක් පවත්වා වගකිව යුතු අය හදුනාගෙන නොතිබුණි.අදාළ අළුත්වැඩියාව සඳහා ගරාජයකට යොමුකර කර ඒ සඳහා රක්ෂණ වන්දි ලබාදීම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ගෙවීම් කිරීමට නොහැකිවීම නිසා දීර්ඝ කාලයක් ගරාජයේ තබා තිබියදි එම අළුත්වැඩියාවට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මහින් රු. මිලියන 11.5 ක මුදලක් වාහන ආනයනය කර බෙදාහරින පෞද්ගලික නියෝජිත ආයතනයක් වෙත ගෙවීම් කර එම ආයතනය වෙත වර්ෂ 05 ක කාලයක් භාවිතා කිරීම සඳහා අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ 2024 පෙබරවාරි 27 දිනැති ලිපිය මහින් ලබාදී තිබුණි. | සංචාරක අමාත්‍යාංශය සතු CAU – 4004 රථයේ අලුත්වැඩියාව සඳහා රක්ෂණ ආයතනය මහින් ආවරණය නොවූ රු.11,516,808 මුදල අමාත්‍යාංශයට ගෙවීමට නොහැකි වූ බැවින් එම මුදල ගෙවීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය එකග විය .හිහ මුදල ගෙවීමෙන් අනතුරුව අංක MT/ADM/01/22/2021/CAU - 4004 හා 2024.02.27 දිනැති ලිපිය මහින් එම කාර්යාංශය වෙත තාවකාලික පදනමින් රථය භාරදුන් බවට අදාළ ලිපි ඇත. | මුදල් රෙගුලාසි අනුව පරික්ෂණයක් පවත්වා වගකිව යුතු අය හඳුනා ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04ක්ද,තෘතියික මට්ටමේ තනතුරු 02ක්ද,ද්විතියික මට්ටමේ තනතුරු 21ක්ද,ප්‍රාථමික මට්ටමේ තනතුරු 06ක්ද පුරප්පාඩුව පැවතිණි. | සහකාර ලේකම්/සහකාර අධ්‍යක්ෂ (ඉඩම් ප්‍රතිපත්ති)/ගණකාධිකාරි ගෙවීම් මෙම තනතුරු දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් බැවින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට අදාල ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.<br>පරිපාලන නිලධාරි තනතුර මේ වනවිට සම්පූර්ණ වී ඇත. ද්විතියික තනතුරු යටතේ වන කළමනාකරණ සේවා නිලධාරි පුරප්පාඩු සහ සංවර්ධන නිලධාරි පුරප්පාඩු සම්බන්ධව 2024.02.29 දිනැති ලිපිය මහින් සංවර්ධන නිලධාරි පුරප්පාඩු සම්බන්ධව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන | පුරප්පාඩු සමාලොචනය කර බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

අමාත්‍යාංශය දැනුවත් කර ඇත.ලඝු ලේඛක (ඉංග්‍රීසි) - මෙම තනතුර සඳහා බඳවා ගැනීම සඳහා විභාගය පැවැත්වුවද ඊට සහභාගි වු කිසිදු අයදුම්කරුවකු සුදුසුකම් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් බඳවා ගැනීමට නොහැකි විය.රියදුරු ප්‍රථමික ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන බැවින් පුරප්පාඩු සම්බන්ධව 2023.12.04 දිනැති ලිපිය එම දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.